# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## බුලත්සිංහල ජනශක්ති මහා සංගමය
## (සංස්ථාගත කිරීමේ)

**බුලත්සිංහල ජනශක්ති මහා සංගමය සංස්ථාගත කිරීම**
**සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු විදුර වික්‍රමනායක මහතා
විසින් 2012 මාර්තු මස 08 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2012 පෙබරවාරි මස 27 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[156 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 8.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

2—PL 006626—750 (2012/03)

# බුලත්සිංහල ජනශක්ති මහා සංගමය (සංස්ථාගත කිරීමේ)

## බුලත්සිංහල ජනශක්ති මහා සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

‘‘බුලත්සිංහල ජනශක්ති මහා සංගමය’’ යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එකී සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කාරණා ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බල ප්‍රදේශය තුළ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී සංගමය සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කරගෙන ගොස් ඇති හෙයින් සහ ඒ සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 2012 අංක දරන බුලත්සිංහල ජනශක්ති මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

බුලත්සිංහල ජනශක්ති මහා සංගමය සංස්ථාගත කිරීම.

2. (මෙහි මින් මතු ‘‘සංගමය’’ යනුවෙන් සඳහන් කරනු ලබන) බුලත්සිංහල ජනශක්ති මහා සංගමයේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් සහ / හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු සාමාජිකයන් වශයෙන් බඳවාගනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු ‘‘සංස්ථාව’’ ලෙස හඳුන්වනු ලබන) ‘‘බුලත්සිංහල ජනශක්ති මහා සංගමය’’ යන අභිධානය සහ නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. පොදු මුද්‍රාවක් තබා ගෙන, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇති අතර, ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද, එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය.

2—PL 006574—75 (2012/02)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) කළුතර දිස්ත්‍රික්කයේ, බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ආර්ථික හා සමාජයීය සංවර්ධනය සඳහා දිරිගැන්වීම;

(ආ) ස්වශක්තිය හා සහභාගිත්වය පදනම් කරගත් සංවර්ධන ක්‍රියාවලියක් ගොඩනැංවීම හා පවුල් සංවර්ධනය සඳහා එය උපයෝගී කර ගැනීම;

(ඇ) කෘෂිකාර්මික, කාර්මික හා ව්‍යාපාර ක්ෂේත්‍රවල සංවර්ධනය අරභයා ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම හා ප්‍රවර්ධනය සඳහා ජනතාව යොමු කිරීම;

(ඈ) ග්‍රාමීය ජනතාව ඉතිරි කිරීම හා අරපිරිමැස්ම සඳහා පෙළඹවීම ;

(ඉ) තරුණ තරුණියන් ආදායම් ඉපැයීමේ ව්‍යාපෘති සඳහා පෙළඹවීම, ව්‍යාපාරික හැකියාවන් වර්ධනය සඳහා රුකුල් දීම, ණය වැඩසටහන් හා පුහුණු වැඩසටහන් සම්පාදනය;

(ඊ) සංස්ථාවේ පරමාර්ථ සාක්ෂාත් කරගැනීමෙහි නිරතව සිටින තැනැත්තන්ගේ පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනික කටයුතු සඳහා ශිෂ්‍යත්ව, මූල්‍යාධාර හා ත්‍යාග ප්‍රදානය;

(උ) බල ප්‍රදේශය තුළ ජනතාවගේ සෞඛ්‍ය, සනීපාරක්ෂාව හා පෝෂණය ප්‍රවර්ධනය සඳහා අනුග්‍රහය ලබාදීම සහ ක්‍රීඩා කෞශල්‍යයන් වර්ධනය සඳහා දිරිගැන්වීම;

(ඌ) ජනතාවගේ ආගමික, සංස්කෘතික හා ආධ්‍යාත්මික සංවර්ධනය ඉවහල් වන වැඩසටහන් හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම;

(එ) බල ප්‍රදේශය තුළ ජනතාව වෙනුවෙන් සුභසාධන පහසුකම් සැපයීම ; සහ

(ඒ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය හා පරිපූර්ණ කරගැනීම සඳහා යෝග්‍ය යැයි සලකනු ලබන පොත්, වාර සඟරා, පත්‍රිකා, ප්‍රවෘත්ති පත්‍ර හා සඟරා මුද්‍රණය කිරීම, පළ කිරීම හා බෙදාහැරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත දැක්වෙන බලතල සංස්ථාවට ඇත්තේ ය:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා ඇප සුරැකුම් ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ රැස්කිරීම;

(ආ) සංස්ථාවේ පරමාර්ථ සාධනය කරගැනීම සඳහා නිරතව සිටින තැනැත්තන්ගේ ඉතිරිකිරීම්, පරිත්‍යාග, භාරගැනීම හෝ රැස්කිරීම;

(ඇ) සංස්ථාවේ පරමාර්ථ සියල්ල ම හෝ ඉන් කිසිවක් හෝ සාක්ෂාත් කරගැනීමට සෘජුව හෝ වක්‍රාකාරයකින් හෝ හිතකර වන නීත්‍යානුකූල භාර ගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ පරිපාලනය කිරීම;

(ඈ) බිල්පත්‍ර, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ ගනුදෙනු කළ හැකි වෙනත් සාධන පත්‍ර ලිවීම, භාර ගැනීම, වට්ටම් කිරීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම සහ බැංකු ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ වැසීම ;

(ඉ) යම් තැනැත්තන්, පුද්ගල මණ්ඩල හෝ ආයතන සමඟ ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීම;

(ඊ) සංස්ථාව විසින් තීරණය කරනු ලබන පරිදි සංස්ථාවේ නිලධරයන් හා සේවකයන් පත්කිරීම, සේවයේ නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ ඔවුන්ගේ සේවය අවසන් කිරීම සහ ඔවුන්ට වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම;

(උ) සංස්ථාවේ පරමාර්ථ ඉටුකරගැනීම සඳහා වහා ම අවශ්‍ය නොවන අවස්ථාවේ මුදල් ශ්‍රී ලංකාණ්ඩුවේ සුරැකුම්පත්වල හෝ වෙනත් ආයෝජනවල ආයෝජනය කිරීම; සහ

(ඌ) සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියා කිරීමේ, කාරණා ඉටුකිරීමේ හා දේවල් ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ කටයුතු සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා නීතිරීතිවලට අනුකූලව කලාප මට්ටමින් මහා සභාවේ දී තෝරා පත්කරගනු ලබන සාමාජිකයන් නව (9) දෙනකුගෙන් හා සභාපති විසින් නම් කරනු ලබන සාමාජිකයින් පස් (5) දෙනකුගෙන් සමන්විත වන "පාලක මණ්ඩලයක්" මගින් පනතේ විධිවිධාන අනුව කළමනාකරණය කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම කරනු ලැබිය යුතු ය.

(2) බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් සංස්ථාවේ සභාපතිවරයා විය යුත්තේ ය.

(3) පාලක මණ්ඩලය විසින් නම් කරනු ලබන සුදුසු පුද්ගලයන් හය (6) දෙනකුගෙන් හා සභාපතිවරයාගෙන් සමන්විත වන හත් (7) දෙනකුගෙන් යුත් බුද්ධි මණ්ඩලයක් සංස්ථාවේ අනුශාසකත්වය හා මඟපෙන්වීම සඳහා පත්කළ යුතු ය.

4. මෙම පනත ක්‍රියාත්මක වන දිනයේ සිට සංගමයේ පාලක මණ්ඩලයේ සාමාජිකයන් වූ තැනැත්තන් සංස්ථාවේ පළමු පාලක මණ්ඩලය විය යුත්තේ ය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාවේ වාර්ෂික මහා සභා රැස්වීමක දී හෝ යම් මහා සභා රැස්වීමක දී හෝ ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් පහත දැක්වෙන කාරණා සියල්ල ම හෝ ඉන් කිසිවක් හෝ සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවලට අනනුකූල නොවන රීති සංස්ථාව විසින් කලින් කල සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.—

(අ) සංස්ථාවේ සාමාජිකයන් බඳවා ගැනීම, ඉවත්වීම, ඔවුන් නෙරපීම, ඔවුන් විසින් ගෙවනු ලැබිය යුතු සාමාජික ගාස්තු හා කොටස් මුදල් තීරණය කිරීම;

(ආ) පාලක මණ්ඩලයේ සාමාජිකයන් තෝරාපත් කරගැනීම, ඔවුන්ගේ ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් පහකිරීම සහ සභාවේ බලතල හා කාර්ය පවත්වාගෙන යාම;

(ඇ) සංස්ථාවේ පාලක මණ්ඩලයේ සහ අනෙකුත් නියෝජිතයන්, නිලධාරීන් හා සේවකයන්ගේ කාර්යයන්, යුතුකම් හා චර්යාව; සහ

(ඈ) සභාවේ, පාලක මණ්ඩලයේ හෝ යම් අනුකමිටුවක රැස්වීම් සම්බන්ධයෙන් ඒ රැස්වීම් කැඳවීම්, පැවැත්වීම්, දැන්වීම් සහ න්‍යාය පත්‍ර, ගණපූරණය හා සාකච්ඡා කළ යුතු කරුණු හා තීරණ ගැනීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය.

2 (1) වන උපවගන්තිය යටතේ සංස්ථාව විසින් සාදන ලද රීති, එම උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් ම එවැනි ම රැස්වීමක දී කලින් කල වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැක්කේ ය.

(3) සංස්ථාවේ සියලු ම සාමාජිකයන්, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

7. 1 සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු ය. තෑගි, තෙස්තමේන්තු නීයාදන, පැවරුම්, පරිත්‍යාග, දායක මුදල්, කොටස් මුදල් හෝ ගාස්තු වශයෙන් සංස්ථාවට ලැබෙන සියලු මුදල් පාලක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන එක බැංකුවක හෝ බැංකු කිහිපයක සංස්ථාවේ නමින් තැන්පත් කරනු ලැබිය යුතු ය.

2. සංස්ථාවේ දේපල පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා ක්ෂයවීමේ අරමුදලක්, සුභසාධන අරමුදලක් හෝ නිදන් අරමුදලක් සංස්ථාව විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

3. සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හා කර්තව්‍ය ඉටුකිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන සියලු ම වියදම් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපල දරනු ලැබිය හැකි බව.**

**8.** යම් මිලට ගැනීමක්, දායක මුදලක්, තෑග්ගක්, ප්‍රදානයක් හෝ තෙස්තමේන්තු නියාදනයක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලබන යම් නිශ්චල හෝ චංචල දේපලක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය සහ ශක්තතාව ඇති අතර, ඒ දේපල විකිණීමට, උකස් කිරීමට, බදුදීමට, හුවමාරු කිරීමට හෝ අන්‍යාකාරයකින් නියාදන කිරීමට පූර්ණ බලය සහිතව තත්කාලයේ, සංස්ථාවේ බලපවත්නා නීතිවලට යටත්ව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපල දැරිය යුතු ය.

**සාමාජිකයන්ගේ වගකීම් සීමා කිරීම.**

**9.** සංස්ථාවේ කිසිම සාමාජිකයෙක් සංස්ථාවේ ණය සහ බැරකම් නිදහස් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සම්බන්ධයෙන්, ඔහුගෙන් සංස්ථාවට අය විය යුතු ඉහත මුදල් ප්‍රමාණය ඉක්මවන යම් සාමාජික මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

**සංගමයට අයවිය යුතු හා සංගමය විසින් ගෙවිය යුතු ණය.**

**10.** මෙම පනත ක්‍රියාත්මක වී ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සංගමයේ සියලු ම ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සංගමයට අයවිය යුතු සියලු ණය, ගෙවිය යුතු දායක මුදල්, සාමාජික මුදල් හෝ කොටස් මුදල් හෝ සම්මාදම් මුදල් මෙම පනතේ කාර්යය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**විසුරුවා හැරීමෙන් පසු ඉතිරි වන දේපල.**

**11.** සංස්ථාව විසුරුවා හරිනු ලැබූ විට එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත්කරනු ලැබීමෙන් පසු කවර හෝ දේපලක් ඉතිරි වේ නම් ඒ දේපල සංස්ථාවේ සාමාජිකයන් අතර, බෙදා දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, යම් ආදායමක් හෝ ලාභ කිසිවක් තම සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කරනු ලැබ ඇත්තා වූ ද, වෙනත් සංගමයකට හෝ සංගම්වලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම සංගමය හෝ සංගම්, සංස්ථාව විසුරුවා හරිනු ලබන අවස්ථාවේ දී හෝ විසුරුවා හැරීමට පෙරාතුව ම හෝ සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

**ගිණුම් කටයුතු.**

**12.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම් හා වියදම්, වත්කම්, බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ "සුදුසුකම්ලත් විගණකවරයා", යන්නෙන්,—

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා නිකුත් කරන ලද සහතිකයන් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

**13.** සංස්ථාවේ මුද්‍රාව, සභාපතිවරයා හෝ කළමනාකරණ අධ්‍යක්ෂ හෝ සභාව විසින් යථා පරිදි බලය පවරනු ලැබූ වෙනත් යම් තැනැත්තකු හෝ ඉදිරියේ මිස කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයේ තම නම අත්සන් කළ යුතු ය. එවැනි අත්සන් කිරීමක් සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සනකට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

**14.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය. ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**15.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.